- **බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුවේ පුහුණුව ලැබීම සඳහා අයදුම්පත්‍රය**

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ පුහුණු තනතුරු සඳහා බඳවාගැනීම

රට හදන සෞභාග්‍යයේ දැක්ම ඔබට රටක්-රටට හෙටක් තේමා කරගනිමින් බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ පුහුණු තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවයි. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව "දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් බිහිකිරීම ප්‍රධාන සංකල්පය කරගනිමින් මෙම වැඩසටහන ආරම්භ කර තිබේ.ඒ සඳහා වන එක් තිරසාර ප්‍රධාන උපාය මාර්ගයක් වශයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල සිටින,අවම අධ්‍යාපන සුදුසුකම් සහිත සාමාජිකයන්ට,විධිමත් වෘත්තීය පුහුණුවක් ලබා දීමෙන් පසුව රජයේ රැකියා ලබා දීමට ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය යොමුව තිබේ.මෙම රැකියා ලබා දීමෙන් ඔවුන් ස්ථිර ආදායම් ලබන්නන් බවට පත් කර එම පවුල් දිළිඳු බවින් මුදවා ගැනීම සහ ශ්‍රම බලකායේ නිපුණතා තුළින් සමෘද්ධිමත් රටක් ගොඩනැගීමේ කාර්යයට සඵලදායී ලෙස දායක කර ගැනීම සඳහා රැකියා ලක්ෂයක් ලබා දීම පිණිස බඳවා ගැනීමේ කටයුතු ජනවාරි (20) දින සිට ආරම්භ කෙරේ. මේ සඳහා පිහිටුවා ඇති බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මගින් විධිමත් ක්‍රමවේදයකට හඳුනාගන්නා රැකියා ලාභීන්ට මාස හයක(06) ක පුහුණුවක් ලබාදේ.

## 1.සුදුසුකම්

අ.අ.පො.ස (සා/පෙළ) සමත්වීමේ මට්ටමට වඩා පහළ මට්ටමේ අධ්‍යාපන සුදුසුකම් සහිතවීම(අධ්‍යාපන

සුදුසුකම් අවම අයදුම්කරුවන්ට ප්‍රමුඛතා දෙනු ලැබේ)

ආ.අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 40ට නොවැඩිවීම(වයස අවුරුදු

35ට අඩු අයදුම්කරුවන්ට ඉහළ ප්‍රමුඛතාව ලැබෙන අතර වයස අවුරුදු 30-40 අතර අයදුම්කරුවන්ට

ඊළඟ ප්‍රමුඛතාවය හිමිවේ)

ඇ.සමෘද්ධි සහනාධාර ලබන පවුලක එහෙත් රැකියා විරහිත සාමාජිකයකුවීම හෝ

ඉ.වයස්ගත,රෝගාතුර දෙමව්පියන් හෝ ආබාධිත සාමාජිකයන් සිටින පවුලක රැකියාවක් නොමැති

සාමාජිකයකුවීම

ඊ.අයදුම්කරන ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම

**2.පුහුණුව සඳහා තෝරා ගැනීම**

2.1 එක් පවුලකින් ඉහත අංක 1හි සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවකු ගැන පමණක් සලකා බලනු ලැබේ

2.2 අයදුම්කරුවන් පදිංචි ගම ආශ්‍රිත ප්‍රදේශවල පවතින රැකියා අවස්ථා සහ අයදුම්කරුවන් ඉල්ලා ඇති පුහුණු ක්ෂේත්‍ර සියල්ලම සැලකිල්ලට ගෙන අදාල වෘත්තීය පුහුණුව සිදුකරනු ලැබේ.

2.3තමා පදිංචි ප්‍රදේශය තුළ හෝ ආසන්න ප්‍රදේශවල පුහුණු මධ්‍යස්ථානවල දී මෙම පුහුණුව සිදුකරනු ලැබේ

2.4.සාර්ථක පුහුණුවකින් පසු ප්‍රදේශයේ හෝ ආසන්න ප්‍රදේශවල රැකියාවල නිරත කරනු ලැබේ

**වැටුප් හා දීමනා**

මාස 06 ක අඛණ්ඩ පුහුණු කාලය තුළ මසකට රුපියල් 22500 ක දීමනාවක් ගෙවනු ලැබේ.සාර්ථකව පුහුණුව නිම කිරීමෙන් පසු තමා පුහුණුව ලැබූ ක්ෂේත්‍රයට අදාලව තමාගේ ස්ථිර පදිංචි ප්‍රදේශය තුළ රජයේ අනුමත ප්‍රාථමික ශිල්පීය නෙවෙන (PL 1) වැටුප් සහ දීමනා හිමි රජයේ ස්ථිර තනතුරකට පත්වීමට පුහුණුලාභින්ට අවස්ථාව ලැබේ.වසර 10ක සතුටුදායක අඛණ්ඩ සේවා කාලයක් සපුරාලීමෙන් පසු රජයේ විශ්‍රාම වැටුපට හිමිකම් ලැබේ.

අයදුම්පත්

මෙම දැන්වීමේ සඳහන් අයදුම්පත් ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් ඔබට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2020.02.15ට පෙර ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරි වෙත භාර දිය යුතුය.

ග .පුහුණුව සඳහා අදාල ක්ෂේත්‍ර

1.කෘෂි නිශ්පාදන සහයක

2.සාත්තු සේවා,පවිත්‍රතා සේවා සහයක

3.ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහයක

4.ආපදා කළමනාකරණ සහයක

5.පරිසර කළමනාකරණ සහයක

6.අළෙවි සේවා සහයක

7.ප්‍රවාහන කටයුතු සහයක

8.පරිගනක,තොරතුරු තාක්ෂණ,දුරකථන ක්‍රියාකරු හා සන්නිවේදන සහයක

9.මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සහායක

10.අරක්කැමි,භෝජනාගාර සේවක හා බොජුන්හල සහයක

11.තරු පංතියේ සංචාරක හෝටල් බංගලා සහයක සහ උද්‍යාන අලංකරණ සහයක

12.ක්‍රීඩා ආයතන කායවර්ධන මධ්‍යස්ථාන සහයක,ක්‍රීඩාංගන,පිහිටුම් තටාක සහයක සහ ජීවිතාරක්ෂක සහයක

13.වඩු කාර්මික හා වඩු සහයක

14.ඇඳුම් මැසීම

15.පෙදරේරු හා පෙදරේරු සහයක

16.රූපලාවන්‍ය මධ්‍යස්ථාන සහයක

17.විදුලි කාර්මික හා විදුලි කාර්මික සහයක සේවා

18.රියදුරු සහ රියදුරු සහයක

19.සත්ත්ව පාලනය හා ධීවර කටයුතු සහයක

20.ඉන්ධන පිරවුම්හල් හා රථවාහන පිරිසිදු කිරීමේ සහයක

21.දැල් හා ධීවර ආම්පන්න අලුත්වැඩියා සහායක

22.අවි රහිත ආරක්ෂක නියාමක

23.පූර්ව ළමා විය සංවර්ධන සහායක

24.වැද්දුම්කරු සහයක සහ ජල නල කාර්මික

25.ගෘහ පාලන,සුහසාධන සහ නඩත්තු


දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
தெஹிவளை பிரதேச செயலகம்
Dehiwala Divisional Secretariat

නො 154, ගාලු පාර, දෙහිවල
இல.154,காலி வீதி, தெஹிவளை
No. 154, Galle Road, Dehiwala

+94112738152 (Hotline)
+94112721431 (Divisional Secretary)
+94112712406 (Assistant Divisional Secretary)
+94112734165 (Accountant)
+94112727141 (Ad Planning)
+94112724487 (Additional District Registrar)
+94112739410

@dsdehiwala1
www.dehiwala.ds.gov.lk
Moha.divi.dehiwala@gmail.com
www.facebook.com/dehiwala.ds.gov.lk


# අයදුම්පත

(ආදර්ශ අයදුම්පත)

| දිස්ත්‍රික්කය | |
|---|---|

**බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ පුහුණුව ලැබීම සඳහා අයදුම් පත්‍රය**

01. මුල් අකුරු සමඟ නම

02. සම්පූර්ණ නම

03. ස්ථිර ලිපිනය

04. දුරකථන අංකය ස්ථිර ජංගම

05. උපන් දිනය

5.1 2020.02.15 දිනට වයස අවුරුදු මාස දින

06. ජාතික හැඳුනුම්පත් අංකය

6.1. රියදුරු බලපත් අංකය (ඇත්නම්)(බර වාහන/ද්විත්ව කාර්ය වාහන/කෘෂි වාහන බලපත්)

07. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල කොටුවේ **X** ලකුණ යොදන්න) ස්ත්‍රී පුරුෂ

08. විවාහක/අවිවාහක බව (අදාල කොටුවේ **X** ලකුණ යොදන්න) විවාහක අවිවාහක

08.1. විවාහක නම් බිරිඳ හෝ ස්වාමි පුරුෂයාගේ රැකියාව ..................................

08.2. අවුරුදු 18 ට අඩු දරුවන් සංඛ්‍යාව ..................................

09. විශේෂ අවශ්‍යතා ඇති (ආබාධිත) සාමාජිකයන් ඇත්නම් ඒ පිළිබඳ විස්තර ..................................

..................................

10. සමෘද්ධි සහනාධාර ලබන පවුලක් ද යන වග (අදාල කොටුවේ **X** ලකුණ යොදන්න) ඔව් නැත

10.1. ඔව් නම් සහනාධාරයේ වටිනාකම ..................................

11. පුහුණුව සඳහා අවශ්‍ය භාෂා මාධ්‍යය (අදාල කොටුවේ **X** ලකුණ යොදන්න) සිංහල දෙමළ

12. පදිංචිය 12.1. පදිංචි දිස්ත්‍රික්කය ..................................

12.2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ..................................

12.3. ග්‍රාම නිලධාරී වසම ..................................

13. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් (ඔබ අධ්‍යාපනය ලබා ඇත්තේ කිනම් ශ්‍රේණියක් දක්වාද යන වග)

..................................

14. වෙනත් සුදුසුකම් (ශිෂ්‍ය භට, ක්‍රීඩා, බාලදක්ෂ, වඩු, මේසන්, විදුලි කාර්මික, පරිගණක හෝ වෙනත් පුහුණු)

..................................

15. අයදුම් කරන පුහුණු ක්ෂේත්‍ර (පසු පිටෙහි දක්වා ඇත)

| පුහුණු ක්ෂේත්‍ර ලේඛනයේ අනු අංකය | ඔබ කැමති පුහුණු ක්ෂේත්‍ර |
|---|---|
| | |
| | |
| | |
| | |

මෙම නිවේදනයේ සඳහන් පුහුණු ක්ෂේත්‍ර අනුව ඔබ කැමති හා ඔබ පදිංචි ප්‍රදේශයේ පවතින රැකියා අවස්ථාවලට ගැලපෙන ක්ෂේත්‍ර 04 ක් අනු පිළිවෙළින් සටහන් කරන්න)

ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සියළුම කොන්දේසි වලට එකඟවන බවත් මා රැකියාවක නිරත නොවන බවත් මෙම පුහුණුව සඳහා සහභාගී වීමට එකඟ වන බවත්, ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි

.

අයදුම්කරුගේ අත්සන .................................. දිනය ..................................

**ග්‍රාම නිලධාරී නිර්දේශය**

ඉහත නම සඳහන් අය මාගේ ග්‍රාම නිලධාරී වසමේ ස්ථිර පදිංචි,වයස අවුරුදු.................................වන, .......................................දක්වා ඉගෙනුම ලබා ඇති, සමෘද්ධි සහනාධාර ලබන පවුලක එහෙත් රැකියා විරහිත සාමාජිකයකු වන අතර / වයස්ගත,රෝගාතුර දෙමව්පියන් හෝ ආබාධිත සාමාජිකයන් සිටින පවුලක රැකියාවක් නොමැති සාමාජිකයකු වන බව සහතික කරමි.

..............................................

ග්‍රාම නිලධාරී අත්සන